| |
|---|
| **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| **දෙවන වාර පරීක්ෂණය - 2018** |

| | | |
|---|---|---|
| **නාට්‍ය හා රංගකලාව** | **09 ශ්‍රේණිය** | **කාලය පැය දෙකකි** |

**නම: ..............................................................**

## I කොටස

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1) නාට්‍ය පෙළක අන්තර්ගත නොවන්නකි,

   i. සංවාද  iii. කැමරාකරණය
   ii. රංග විධාන  iv. ආනුෂංගික කලා

2) නාට්‍ය පෙළක අනිවාර්යෙන් අන්තර්ගත විය යුත්තකි,

   i. සට්ටනය  iii. අංග රචනය
   ii. සංගීතය  iv. ප්‍රේක්ෂක ප්‍රතිචාර

3) නාට්‍ය ධර්මී නාට්‍ය සඳහා බොහෝවිට යොදා නොගන්නා අනුෂංගික අංගයකි,

   i. රංගවස්ත්‍රාභරණ  iii. රංගාලෝකය
   ii. අංග රචනය  iv. පසුතල

4) ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී නාට්‍ය ලක්ෂණ මිශ්‍රව පවතින නාට්‍යයකි.

   i. සිංහබාහු  iii. කදාවළලු
   ii. මනමේ  iv. දික්තල කාලගෝල

5) කදාවළලු නාට්‍ය සඳහා පාදක කොටගත් කතා වස්තුව උපුටාගෙන ඇත්තේ පන්සිය පනස් ජාතකයේ එන,

   i. කාලගෝල ප්‍රශ්නයෙන්  iii. ගෝල කාල ප්‍රශ්නයෙන්
   ii. නලපාන ජාතකයෙන්  iv. සේරිවානිජ ජාතකයෙන්

6) නාට්‍යක ගැටුම ඇති වනුයේ,

   i. චරිත අතර ප්‍රතිවිරෝධී අදහස් මතු වීමෙන්.
   ii. චරිත අතර සමාන අදහස් මතු වීමෙන්.
   iii. චරිත අතර සමීප සබඳතා ඇතිවීමෙන්.
   iv. චරිත අතර දුරස්වීම ඇති වීමෙන්.

7) කදා වළලු නාට්‍යයේ සිටු දියණියගේ වස්ත්‍රාභරණ අයත්වන්නේ,

   i. ආංගික අභිනයට  iii. අභ්‍යාන්තර සමාරෝපයට
   ii. බාහිර සමාරෝපයට  iv. සාත්වික අභිනයට

8) භූමිකා නිරූපණය තුළින් සිදු නොවන්නේ,

i. රූපණ කුසලතා වර්ධනය වීම.
ii. හඬ පාලනය ඇතිවීම.
iii. මනා පෞරුෂයක් ඇති වීම.
iv. සුන්දර පෙනුමක් ලැබීම.

9) ඔෂින් යනු,

i. ජනකතාවකි.
ii. වේදිකා නාට්‍යකි.
iii. චිත්‍රපටයකි.
iv. රූපවාහිනී නාට්‍යයකි.

10) රචකයකුට නාට්‍ය පිටපතක් ලිවීමේ දී වඩාත්ම වැදගත් වනුයේ,

i. සමාජීය දැනුම
ii. පරිකල්පන ශක්තිය
iii. විචාරශීලි බව
iv. අතීතය පිළිබඳ දැනුම

- **ප්‍රශ්න අංක 11 -15 දක්වා ප්‍රශ්න සඳහා පහත දක්වා ඇති ගොනුවෙන් අදාළ පිළිතුර තෝරා ලියන්න.**

(රෝමෝද්ගමනය, දර්පණතල අභ්‍යාස, සාත්ත්වික අභිනය, සතර අභිනය, රිද්මය, සමාරෝපය)

11) චරිතයක් අනුකරණය කිරීමේ දී ............................................ භාවිතා වේ. ,

12) නළුවා බාහිරව හා අභ්‍යන්තරිකව චරිතය බවට පත්වීම ......................................................... වේ.

13) ඇස් අතර සබඳතාව පවත්වා ගැනීමට ........................................................ වැදගත් වේ.

14) මනස මූලිකව හටගන්නා භවයන් ශාරීරික වශයෙන් ප්‍රකට කරවීම ............................................වේ.

15) නොසිතූ අවස්ථාවකට මුහුණ දීමේ දී චරිතයක් තුළ ඇතිවිය හැකි බාහිර වෙනස්කමක් වන්නේ ............................................ යි.

- **පහත තොරතුරු ඇසුරින් අංක 16-20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A. මිලින්ද ප්‍රශ්නය.
B. එලොව ගිහින් මෙලොව ආවා.
C. මුහුදු පුත්තු.
D. දොරකඩ අස්න.
E. නරි බෑණා.
F. ජනේලය.

16) ලක්දිව බෞද්ධ පූජා කර්ම දෙකකි,

i. BC  ii. AD  iii. FE  iv. CD

17) ගුණසේන ගලප්පත්ති මහතාගේ නාට්‍ය නිර්මාණයකි.

i. A  ii. B  iii. C  iv. F

18) මනමේ නාට්‍ය නිර්මාණ කළ නාට්‍යවේදියාණන්ගේ නාට්‍යයකි,

i. A  ii. B  iii. C  iv. F

19) ''සුරුට්ටුද බොන්නේ - බුලත්මද කන්නේ
හෙනං ගෙන එන්න - සුරුට්ටුව බොන්න යන සංවාද ඛණ්ඩය සහිත නාට්‍ය වන්නේ,

i. B  ii. C  iii. E  iv. F

20) හෙන්රි ජයසේන මහතාගේ නාට්‍ය නිර්මාණයක් වන්නේ,

i. A  ii. C  iii. E  iv. F

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**

❖ A : මේ අවේලාවේ ඔබ වහන්සේ මේ විමානයට වැඩියේ ඇයි?

❖ B : එන්නම වුවමනා නිසා තමා මම ආවේ, ඔබ ඉඩදෙනවා නම් මම කැමති මෙහෙ නවාතැන් ගන්න අද රාත්‍රියට.

1)

i. ඉහත සංවාද ඛණ්ඩය අයත් නාට්‍යමය අවස්ථාව කුමක් ද? (ල. 1)

ii. A B ලෙස දැක්වෙන්නේ කවුරුන්දැයි වෙන වෙනම නම් කරන්න. (ල. 1)

iii. මෙම නාට්‍යම අවස්ථාවට අදාළ වූ කථා පුවත කෙටියෙන් දක්වන්න. (ල. 4)

iv. මෙම නාට්‍යමය අවස්ථාවට අදාළ කතා පුවත ඉදිරිපත් කිරීමට පහත ප්‍රාසාංගික ලක්ෂණ යොදා ගෙන තිබූ අයුරු පැහැදිළි කරන්න.

❖ චරිත කවුරුන්ද නම්කරන්න

❖ ප්‍රේක්ෂකයෝ කවුරුන්ද දක්වන්න.

❖ අංග රචනය කර ඇත්තේ කෙසේද?

❖ පසුබිම සංගීතය යොදා ගනු ලැබුයේ කෙසේද?

❖ රංග භූමිය කුමක්ද? (ල. 2 බැගින්)

2)

i. ප්‍රධාන නාට්‍ය ශෛලීන් නම් කරන්න. (ල. 02)

ii. ප්‍රධාන නාට්‍ය ශෛලීන් හී භාවිතා වන සංවාද වල ලක්ෂණ වෙන් වෙන් වශයෙන් නම් කරන්න. (ල. 04)

iii. ''පන්ති කාමරයට අද්භූත පුද්ගලයෙක් පැමිණීම'' යන සිදුවීම නාට්‍ය නිර්මාණයක් ලෙස ප්‍රේක්ෂකයා හමුවට ගෙන ඒමට වඩාත් සුදුසු නාට්‍ය ශෛලිය කුමක්ද? එම ශෛලියෙන් එම සිදුවීමට අදාළ දෙබස් ඛණ්ඩයක් නිර්මාණය කරන්න.

3)

i. සතර අභිනය නම් කරන්න.

ii. සතර අභිනය විස්තර කරන්න.

iii. සතර අභිනය යොදා ගැනීමෙන් වේදිකා නාට්‍ය සාර්ථක වන අන්දම ඔබ නැරඹූ නාට්‍යයක් ඇසුරින් පැහැදිලි කරන්න.

4) පාසල් විවේක කාලයේ දී චාමර ඔහුට සිය මව උපන් දිනයට දුන් අලුත්ම බෝතලය සිය යහළුවන්ට පෙන්වයි. ඔහු කෑම කා අත සෝදා යළි පැමිණෙන විට පන්තියේ සිටි දඟම ළමයා එය උඩ දමමින් සෙල්ලම් කරමින් සිටී. එක්වර බෝතලය ඔහු අතින් ගිලිහී බිම පතිතව බිඳී යයි....

ඉහත කතාව ඔබ කැමති අවසානයක් කරා ගෙන යමින් කෙටි නාට්‍ය පෙළක් රචනා කරන්න.

- සංවාද, රංගවිධාන සහිත පෙළ රචනයට. (ල. 06)
- නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය. (ල. 06)